**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 01 . මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය සඳහා ගෙවා තිබුණු එකතුව රු.187,635 ක් වූ පොලී, ආදායම් වියදම් ගිණුමේ ඇතුළත් නොකිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු ප්‍රතිපාදන මත නිමකර මුදල් ගෙවා තිබූ එකතුව රු. 7,770,163 ක් වටිනා ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.865,725 ක මුද්දර ගාස්තු රු.496,775 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.368,950 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.376,763 ක් ප්‍රතිපූර්ණය කිරීමේදී ආදායමක් ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතුව රු.17,222,234 ක්වූ කර්මාන්ත ණයහිමියෝ මූලධන වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූලධන වියදම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.18,979,754 ක කර්මාන්ත ණයගැතියෝ මූලධන ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූලධන ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේ වටිනාකම රු. 34,342,085 ක් ලෙස ගිණුම් ගතකර තිබුණද එහි මුළු කොන්ත්‍රාත් ගෙවීම් වටිනාකම රු.35,359,670 ක් වුයෙන් ඉඩම් හා ගොඩනැගිලි රු.1,017,585 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2016 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු උසාවි දඩ ආදායම් එකතුව රු.57,500 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමේ ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 03කට අදාලව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛන අනුව ශේෂ, අදාල ලෙජර් ගිණුම් ශේෂ සමඟ සැසඳීමේදී රු.211,026 ක වෙනසක් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 37 කට අදාලව 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ ඇතුළත් ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර රු.15,083,041 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

දීර්ඝ කාලයක සිට පැවත එන රු.667,094 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් සහ රු.108,011 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,790,461 ක් වූ ගිණුම් විෂයන් 03 ක් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති , රෙගුලාසි, හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. |
| (ii) රීති 33 | වරිපනම් ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,694,977 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,963,457 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| ආදායම් වර්ගය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017.01.01 හිඟය වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017 බිල්කළ මුදලින් වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 559,780 | 1,310,413 | 64,275 | 894,809 | 911,109 |
| ව්‍යාපාර බදු | - | 600,000 | - | 737,700 | - |
| කසල බදු | 77,078 | 385,000 | 9,000 | 385,000 | 68,078 |
| වෙළඳ බලපත්‍ර | - | 250,000 | - | 374,950 | - |
| දැන්වීම් පුවරු | - | 300,000 | - | 353,000 | - |
| එකතුව | 636,858 | 2,845,413 | 73,275- | 2,745,459 | 979,187 |

2.2.2.1 වරිපනම් හා බදු

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.559,780 ක්වූ හිඟ වරිපනම් වලින් වර්ෂය තුළ රු.64,275 ක් අයකරගෙන තිබුණු නමුත් වර්ෂය අවසානයේ පැවති මුළු එකතුව රු.911,109 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීම පිණිස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ හිටි වරිපනම් ශේෂය රු.637,268 ක් වූ අතර සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම ශේෂය රු.559,780 ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශන සහ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අතර රු.77,488 ක අසමානතාවයක් නිරීක්ෂණය වූ නමුත් එයට හේතු පැහැදිලි කිරීමට ලේකම්වරයා අසමත් වුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,736,055 ක් හා මුද්දර ගාස්තු රු. 287,345 ක් විය.

2.2.4 කසල ගාස්තු

--------------

2017 වර්ෂය ආරම්භයේ පැවති රු.77,078 ක හිඟ හිටි කසල ගාස්තු ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.9,000 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර තවදුරටත් රු.68,078 ක් අයකර ගත යුතුව පැවතුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා සභාව විසින් පනතේ 122 වගන්තිය හි සඳහන් ලෙස අතුරු ව්‍යවස්ථා පනවා ඊට අදාල බලතල ලබාදිය යුතු නමුත් සභාව විසින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 34.1 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 9.6 ක් සහා අරමුදලට වැය බරක් කර තිබුණු නමුත් ඒ

මගින් ඉටු කළයුතු කාර්යයන් මොනවාද යන්න හදුනාගැනීම පිණිස ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ ඉටු කළ කාර්යයන් තහවුරු කිරීම සඳහා කාර්ය සාධන වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

ආර්ථික අපහසුතා පවතින ආගමික සිද්ධස්ථානවල ව්‍යාපෘති 26 ක් ඉටුකිරීම සඳහා රු.2,300,000 ක ප්‍රතිපාදන පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුවෙන් ලැබී තිබුණු නමුත් එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළ නිමකර නොතිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

------------------

සභාව රැස්කරනු ලබන කැලිකසළ වලින් දිරාපත් නොවන අපද්‍රව්‍ය පිළිසරු ව්‍යාපෘතිය අසල රජයේ භූමියක වලක් සාදා බැහැරකර මාසිකව එය මතුපිටින් පස් දමා වසා දමන බව දක්වා තිබුණද වර්ෂා කාලයේදී වලට වතුර පිරීමෙන් හා කැලි කසළ පරිසරයට නිරාවරණය වීමෙන් ප්‍රදේශවාසීන්ට විවිධ සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීමට සිදුවිය හැකි අතර දිරාපත් නොවන ද්‍රව්‍ය පරිසරයට මුදාහැර දහනය කිරීමෙන් විෂවායු පිටවී පාරිසරික හානියක් සිදු විය හැකි බවත් නිරීක්ෂණය විය.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් ප්‍රකාශිත තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු බැවින් සභාවට අදාල අරමුණු,ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන, ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හා අනෙකුත් සම්බන්ධිත රාජ්‍ය ආයතන පිළිබඳව හඳුනා ගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුරනැගුම ව්‍යාපෘතිය මගින් අළුත්වැඩියා කටයුතු සිදුකර ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණු සංචාරක බංගලාව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රධාන මුදල් පොත, සේවක ණය ලේඛනය, නිසි පරිදි නඩත්තු කර නොතිබුණ අතර සටහන් කිරීම් පැන්සලෙන් කර තිබුණි.

3.3 හඳුනාගත් පාඩු

------------------

රු. 31,369 ක් වටිනා පුස්තකාල පොත් අස්ථානගත වී තිබුණ නමුත් ඒ සම්බන්ධව මු.රෙ. 104 සිට 109 දක්වා වූ උපදෙස් ප්‍රකාර කටයුතු කර අලාභ පොතෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර සියයට 43 සිට

සියයට 96 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව පත් කළ අභ්‍යන්තර විගණන නිලධාරියා ආයතනයේ කටයුතු විධිමත් කිරීමට සහයෝගය ලබාදී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර තිබුණ චක්‍රලේඛය අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගනුදෙනු නිසිපරිදි හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (ඇ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | දිරාපත් නොවන සන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය නොකිරීම. |
| (ඈ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | දීර්ඝකාලීනව පැවත එන ශේෂ හඳුනාගෙන නිරවුල් නොකිරීම. |
| (ඉ) | අභ්‍යන්තර පාලනය | i. අභ්‍යන්තර විගණනය නිසි පරිදි සිදුනොකිරීම.<br>ii. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි නොපැවැත්වීම |